**එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම - 2023**

**-----------------------------------------------------------------------------**

එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට අදාළව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2016 වර්ෂයේ සිට 2023 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2024 ඔක්තෝබර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයත් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාල සීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. විගණන නිරීක්ෂණ.**

**2.1 සමාගම පිහිටුවීම.**

2014 අප්‍රේල් 25 දිනැති අංක 2014/11 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් "මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ "එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" ස්ථාපිත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම" සඳහා මහාමාර්ග, වරාය හා නාවික කටයුතු පිළිබඳ ගරු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව සඳහා 2014 මැයි 08 දින අංක 14/0530/505/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, පූර්ණ වශයෙන් රජය (මහා භාණ්ඩාගාරය) සතු සමාගමක් වශයෙන්, "එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමටත්, නව සමාගම මහා භාණ්ඩාගාරයේ සෘජු අධීක්ෂණයට යටත් වීමටත්, සමාගමේ හිමිකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම ආදිය සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළත්ව පිළියෙල කරනු ලබන එකී සාංගමික ව්‍යවස්ථාවලිය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමටත් යටත්ව මෙම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

2014 අප්‍රේල් 25 ඉදිරිපත් කල උක්ත අමාත්‍යමණ්ඩල සංදේශයට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ ලෙස දක්වා තිබුනේ 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ සමාගමක් පිහිටුවීමට ප්‍රතිපාදන නොමැති බැවින් ඉහත කී සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සම්පූර්ණ පාලන හිමිකම රජය (මහා භාණ්ඩාගාරය) සතු සමාගමක් වශයෙන් මහා මාර්ග වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතට ගැනෙන පරිදි පිහිටුවීම සුදුසු බවයි.

2007 අංක 07 දරණ සමාගම් පනතේ 05 වන වගන්තිය යටතේ 2014 මැයි 06 දින "එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්" පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබුණු අතර, 2015 ජූනි 17 දිනැති 3/2015 අංක දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 1.6 වගන්තිය ප්‍රකාරව මෙකී සමාගම "E කාණ්ඩයේ" රජයට අයත් ව්‍යාපාරයක් ලෙස හඳුනාගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මාර්ග සංවර්ධන අධිකාරියේ සම්පූර්ණ හිමිකම්කාරිත්වය යටතේ අනුබද්ධිත සමාගමක් ලෙස මෙම සමාගම පිහිටුවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් 2014 අප්‍රේල් 07 ඉදිරිපත් කර තිබූ අංක 1551/2014 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. නමුත් උක්ත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව සමග යෝජිත සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ කෙටුම්පතක් ඉදිරිපත්කර නොතිබුණි. ඒ පිළිබඳ හෝ අදාල සමාගම පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය ලැබී ඇති බවට තහවුරු කරගැනීමකින් තොරව සමාගම පිහිටුවීමට ගෙන තිබූ උක්ත තීරණය මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

(ආ) මෙම සමාගම මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, පූර්ණ වශයෙන් රජය (මහා භාණ්ඩාගාරය) සතු සමාගමක් වශයෙන් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ස්ථාපිත කලයුතු බවට 2014 මැයි 08 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණද එයට අනුගත නොවී මාර්ග සංවර්ධන අධිකාරියට පූර්ණ හිමිකාරිත්වය සහිත සමාගමක් ලෙස 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2014 මැයි 06 දින PV 98435 අංකය මගින් සමාගම සංස්ථාගත කර තිබුණි.

(ඇ) උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව "නව සමාගම මහා භාණ්ඩාගරයේ සෘජු අධීක්ෂණයට යටත් විය යුතු අතර සමාගමේ හිමිකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන" ඇතුළත්ව සාංගමික ව්‍යවස්ථාවලිය මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය මත ලබාගත යුතු බව තීරණය කර තිබූ අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාගමේ ලේකම් ලෙස කටයුතු කරන පුද්ගලික සමාගමක් විසින් 2014 අප්‍රේල් 25 දින මෙම සමාගම පිහිටුවීමට අදාලව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කර තිබූ සාංගමික ව්‍යවස්ථාවලිය තුල පහත සඳහන් කරුණු ඇතුළත්ව නොතිබුණි.

- නව සමාගම මහා භාණ්ඩාගරයේ සෘජු අධීක්ෂණයට යටත් විය යුතු බව
- සමාගමේ හිමිකාරිත්වය හා අධ්‍යක්ෂක මණ්ඩලය පත්කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළත් සාංගමික ව්‍යවස්ථාවලිය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගත යුතුබව.
- අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හා අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය .

## 2.2 සමාගම පාලනය හා මෙහෙයවීම

සමාගම පාලනය හා මෙහෙයවීම සඳහා පත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලයට, මාර්ග සංවර්ධන අධිකාරියේ නිත්‍ය තනතුරු දරන නිලධාරීන් දෙදෙනකුද මහා භාණ්ඩාගාරයේ නියෝජිතවරයකු හා පෞද්ගලික අංශයේ නියෝජිතයන් දෙදෙනකුද පත් කර තිබූ අතර ඒ අතරින් එක් අයෙකු සභාපතිවරයා ලෙස තෝරාගෙන තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ඉහළ කළමනාකරණය සඳහා සභාපති, සාමාන්‍යාධිකාරී, සහ සාමාන්‍යාධිකාරී යටතේ ගණකාධිකාරී හා කළමනාකරුවන් තිදෙනෙකුගෙන් සමන්විතව කාර්ය මණ්ඩලය පත්කර ගෙන තිබුණි. වර්තමානයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිළිබඳ තොරතුරු පමණක් විගණනය වෙත ඉදිරිපත් වූ අතර ඊට පෙර සිටි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පිළිබඳ තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

## 2.3 වත්කම්, වගකීම් ආදායම් හා වියදම්.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන පිළියල කර අනුමත කර නොතිබූ අතර මාර්ග සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් 2023 ඔක්තෝබර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයක් පමණක් පිළියෙල කර ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාව අනුව 2023 ඔක්තොම්බර් 31 දිනට හා 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව වත්කම් හා බැරකම් පහත පරිදි විය.

| විස්තරය | 2023 ඔක්තෝබර් 31 දිනට අභ්‍යන්තර විගණක විසින් පිළියෙල කරන ලද වාර්තාව අනුව වටිනාකම (රු.) | 2015 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු) | වෙනස (රු) |
|---|---|---|---|
| මුළු වත්කම් | 3,398,677 | 168,027,897 | (164,629,220) |
| මුළු හිමිකම | (132,506,549) | 8,911,197 | (141,417,746) |
| මුදල් ලැබීම- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 56,284,248 | - | 56,284,248 |
| මුළු වගකීම් | 79,620,978 | 159,116,699 | (79,495,721) |

2015 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම් හා වියදම් පහත පරිදි වේ.

| විස්තරය | 2015 දෙසැම්බර් 31 දිනට විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.) |
|---|---|
| ආදායම | 78,760,637 |
| විකුණුම් පිරිවැය | (70,455,661) |
| දළ ලාභය | 8,304,976 |
| අනෙකුත් ආදායම් | 1,080,402 |
| වියදම් | (24,511,695) |
| ලාභය/ (අලාභය) | (15,126,316) |

එමෙන්ම 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාවේ මතය ව්‍යාවනය කර තිබුණි.

**2.4 විගණනයට සාක්ෂි නොවීම.**

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අනුරූපීව 2023 ඔක්තෝබර් 31 දිනට පැවැති වත්කම් / වගකීම්/ හිමිකම් වටිනාකම් වෙනස්වීම පිළිබඳ සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි.

(ආ) 2016 - 2023 කාලපරිච්ඡේදය තුල උපයන ලද ආදායම් හා වියදම් හා ඒවා තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි.

(ඇ) 2023 ඔක්තෝබර් 31 දිනට අභ්‍යන්තර විගණන අංශය විසින් පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ව්‍යාපෘතියක් වෙනුවෙන් බාහිර පාර්ශවයකට ගෙවිය යුතු රු.මිලියන 6 ක් නිරවුල් කර තිබුණ ද, එය තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි.

(ඈ) Smart Bus Halt – 3000 ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 04 හා 10 යන දිනයන් හි දී පිළිවෙළින් බාහිර පාර්ශවයන්ගෙන් රු.මිලියන 2 ක් හා රු.මිලියන 13 ක් සමාගම ලබා ගෙන තිබුණ ද, එවැනි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි.

**2.5 සමාගමේ අඛණ්ඩ පැවැත්ම.**

එක්ස්ප්‍රස්වේ ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සම්බන්ධව ප්‍රවාහන හා මහමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 මැයි 26 දිනැති අංක 28/2023 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023 ජුනි 26 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි අනුමැතිය ලබා දී තිබුණි.

නමුත් අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.1, 3.3, හා 3.4, යෝජනා සම්බන්ධව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ පහත දැක්වෙන නිරීක්ෂණවල දක්වා ඇති පරිදි අවශ්‍ය පියවර ගන්නා ලෙස නියම කර තිබීම හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රශ්නකාරි විය.

(3.1) සමාගම සතු සියළුම බස්රථ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත භාර දීම හා අනෙකුත් සියළු වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ආපසු ලබා දීම හා සියළුම සේවකයන්ට ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමය යටතේ වන්දි ලබා දීම යන යෝජනා සඳහා මුදල් අමාත්‍යවරයා විසින් සමාගමේ සියලු සේවකයින් ස්වේච්ඡා විශ්‍රාම ක්‍රමයක් අනුගමනය නොකර සමාගමේ සියලුම සේවකයින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත අනුයුක්ත කිරීමට හා බස්රථ ඇතුළු සියළුම වත්කම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පවරා දීමට නිර්දේශ කර තිබුණි.

(3.3) බාහිර පාර්ශවයන්ගේ සියලු ණය හා වගකීම් නිරවුල් කිරීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අරමුදල් යොදා ගැනිමට මුදල් අමාත්‍යවරයා විසින් නිර්දේශ කර තිබුණි.

(3.4) එමෙන්ම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පත් කරන ලද ඈවරකරුවෙකු මගින් සමාගම අවසන් කිරීමට නියම කර තිබුණි.

**2.6 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනත | | | |
| i. 133 වගන්තිය (1) (2)වන උප වගන්තියේ සහ 144 වන වගන්තිය | එක් එක් ලිත් වර්ෂයකට වරක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස් හිමියන්ගේ වාර්ෂික රැස්වීම කැඳවිය යුතු වුවත්, 2014 වර්ෂයෙන් පසුව වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | 2007 අංක 07 දරණ සමාගම් පනතේ 133 වගන්තිය හා 187 (1) වගන්තියට අනුකූලව කටයුතු කළ යුතුය. |
| ii. 150 (1) වගන්තිය | සමාගම ශේෂ පත්‍ර දිනයෙන් පසුව මාස 06 ක් ඇතුළත හෝ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිශ්චය කරනු ලබන පරිදි දීර්ඝ කරන ලද යම් කාලයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් 2016 වර්ෂයේ සිට සමාගම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | සමාගමේ මූල්‍ය ප්‍රකාශන කඩිනමින් පිළියෙල කර අනුමත කල යුතුය. මෙම වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් හඳුනාගෙන විනයානුකූල ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| iii. 166 වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ ශේෂ පත්‍ර දිනයට පසු මාස 06 ක් ඇතුළත ඒ දිනෙන් අවසන් වන ගිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් පිළියෙල කරනු ලැබිය යුතුය. නමුත් සමාගම 2016 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පිළියෙල කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | සමාගමේ වාර්ෂික වාර්තා කඩිනමින් පිලියල කර ඉදිරි පත් කල යුතුය. මෙම වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් හදුනාගෙන විනයානුකුල ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ආ) 2021.11.16 දිනැති අංක 01/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ හඳුන්වා දුන් රජය සතු ව්‍යාපාර සඳහා යහපාලන පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය | | | |
| i. 2.2.2 වගන්තිය | සභාපතිවරයා විසින් සෑම මසකට වරක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතුය. ඒ අනුව, සමාගම ආරම්භ කළ 2014 මැයි මස සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා, අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 116 ක් පැවැත් විය යුතු වුවත් සමාගම ආරම්භ කර දින සිට 2023 ජුලි මස දක්වා පවත්වා තිබුණේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 30 ක් පමණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |
| ii. 5 පරිච්ඡේදය | ක්‍රියාකාරී සැලැස්ම සහ අදාළ වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය සමඟ මූල්‍ය පුරෝකථනය ඇතුළත් පස් අවුරුදු කාලයක් සඳහා සමාගම උපායමාර්ගික සැලැස්මක් සකස් කර අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා හරහා භාණ්ඩාගාර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර ව්‍යාපාරික පරිසරයේ වෙනස්වීම්වලට අනුකූලව සෑම වසරකම එම සැලැස්ම යාවත්කාලීන කළ යුතු අතර ඊළඟ වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කළ යුතුවුවත් එසේ කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය |
| iii. 6.6 ඡේදය | සෑම සමාගමක්ම වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමඟ විගණකාධිපතිට ඉදිරිපත් කල යුතු වුවද සමාගම 2016 වර්ෂයේ සිට | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | මෙම වගකීම් පැහැර හැර ඇති නිලධාරීන් හදුනාගෙන විනයානුකුල ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2023 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| | iv. 6.7 ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකොට එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු වාහාම සිදු කර ඌණතාවයන් හා අතිරික්තයන් හඳුනාගත යුතුය. |
| (ඈ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ (1998 දෙසැම්බර් 31 දින දක්වා සංශෝධිතයන් ඇතුලත්ව) 15 වගන්තිය. | සේවා යෝජක සේවකයෙකුගේ ඉපැයීම් වලින් ඊළඟ මාසයේ අවසාන දිනයට පෙර එක් එක් මාසය සඳහා අදාල දායක මුදල අරමුදලට ගෙවිය යුතුය. නමුත්, 2020 මාර්තු සිට 2023 ජුනි දක්වා සේවකයන්ට ගෙවිය යුතු හිඟහිටි සේවක අර්ථ සාධක අරමුදල් වටිනාකම රු.මිලියන 23.34 ක් වූ අතර, මේ තුළ ඇතුලත් ගෙවිය යුතු අධිභාරය රු.මිලියන 7.3 ක් විය. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | පනතේ විධිවිධානයන්ට අනුකූලවසේවක අර්ථ සාධක අරමුදල් ගෙවිය යුතු අතර අධිභාරයට වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන එම මුදල අයකල යුතුය. |
| (ඉ) | 1980 අංක 46 දරන සේවක භාරකාරක අරමුදල් පනත 16 වගන්තිය | සේවායෝජක විසින් ඒ සේවානියුක්තිකයන් තම සේවය සඳහා නියුක්ත කරනු ලබන එක් එක් මාසය වෙනුවෙන්, ඒ මාසය ඇතුළත ඔවුන් උපයන මුළු ඉපයීම් වලින් සියයට 03ක දායක මුදලක් ඊළගට එළෙඹෙන මාසයේ අවසාන දින හෝ එදිනට පෙර අරමුදලට ගෙවීමට ඒ සේවායෝජකයා යටත් විය යුතුය. නමුත්, 2021 මැයි සිට 2023 ජුනි දක්වා සේවකයන්ට ගෙවිය යුතු හිඟහිටි සේවක භාරකාර අරමුදල් වටිනාකම රු.මිලියන 1.7 ක් වූ අතර, මේ තුළ ඇතුලත් ගෙවිය යුතු අධිභාරය රු.මිලියන 0.63 ක් විය. | කළමනාකරණය අදහස් දක්වා නොතිබුණි. | පනතේ විධිවිධානයන්ට අනුකූලව සේවක භාරකාර අරමුදල් ගෙවිය යුතු අතර අධිභාරයට වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන එම මුදල අයකල යුතුය. |

**3. සමාගම අවසන් කිරීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම.**

(අ) ප්‍රවාහන හා මහමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 මැයි 26 දිනැති අංක 28/2023 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි සමාගම සතු සියළුම බස්රථ සහ මගී සේවා අවසරපත් සියයට 15 ප්‍රමාණය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත ලබා දීමට 2023 ජුනි 26 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදි අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව සමාගම අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නමින් ලියාපදිංචි කරන ලද රු.මිලියන 216 ක වටිනාකමින් යුත් බස්රථ 20ක් ස්වාධින තක්සේරුවකු විසින් තක්සේරුකර පවරාදීම වෙනුවට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සියලුම බස්රථ රු.මිලියන 109.4 කට තක්සේරු කර හා අධිවේගී මාර්ගයේ සමස්ත ධාවන වාර වලින් සියයට 15ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත භාර දී තිබුණි.

(ආ) උක්ත "අ" හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගම සඳහා පත්කර ඇති අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැරීම හා ඈවරකරුවෙකු හරහා සමාගම අවසන් කිරීමට ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍ය ලේකම් සමාගම වෙත නියම කර තිබුණි. නමුත් වසරකට වැඩි කාලයක් ගතව ඇතත් මෙම තීරණයන් ක්‍රියාත්මක කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඇ) එමෙන්ම උක්ත අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීම ක්‍රමය ඇතුළුව (කල්බදු ණය රහිතව) සමාගම විසින් ගෙවිය යුතු බැරකම් ලෙස රු.මිලියන 77.07 ක් හඳුනාගෙන තිබුණි. එම වටිනාකමින් රු.මිලියන 18.31 ක් පමණක් 2024 ජනවාරි 31 දිනට නිරවුල් කර තිබුණි. තවදුරටත් නිරවුල් කිරීමට ඇති වටිනාකම රු.මිලියන 58.76 ක් බව නිරික්ෂණය විය.

(ඈ) ප්‍රවාහන හා මහමාර්ග අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 13 දිනැති අංක 76/2023 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් යෝජනා අංක 3.1 හා 3.2 පරිදි සමාගමෙහි සමස්ත සේවකයින් සංඛ්‍යාව වූ 42න් 29 ක් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියට අනුව අනුයුක්ත කිරීමටද සුදුසුකම් නොමැති රියදුරන් හා කොන්දොස්තරවරුන් 13 දෙනෙක් ඔවුන්ට පෞද්ගලික වන සේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ ඔවුන් විශ්‍රාම යන තෙක් රඳවා ගැනීමට හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත අනුයුක්ත කිරීමේදී ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති සේවකයින් 13 දෙනෙකු සඳහා ගෙවිය යුතු රු. මිලියන 10.93 ක වන්දි මුදල ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙතින් දැරීමටත් 2024 ජනවාරි 08 දින පැවැත්වුණ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි. ඒ අනුව, සේවකයින් 29 දෙනෙකු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුයුක්ත කර තිබු අතර ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති සේවකයින් සඳහා ගෙවිය යුතු රු. මිලියන 5.74 ක ඉතිරි වන්දි මුදල 2024 ඔක්තෝබර් 31 වන විටත් ගෙවා නොතිබුණි.